**ශීර්ෂය 320 - සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 320 - සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජුනි 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|
| 1.6.1.1 | දෙපාර්තමේන්තුවට වෙනම ආදායම් ශීර්ෂයක් ලබා ගැනීමට කටයුතු කළ යුතුවීම. | 1.6.2 (අ) (i) |
| 1.6.1.2 | අදාළ හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතු වීම. | 2.1 |

| | | |
|---|---|---|
| 1.6.2.1 (අ)(ආ)(ඇ) | අදාළ වත්කම් ලේඛනගත කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවීම. ස්ථාවර වත්කම් ලේඛනය නිවැරදිව නඩත්තු කළ යුතු වීම. | 1.6.2 (ආ) |
| 2.1 | අත්තිකාරම් ණය ශේෂ කඩිනමින් අයකර ගත යුතු වීම | 3.5(එ)(ඔ) |
| 2.2 | කඩිනමින් බැරකම් බේරුම් කිරීමට කටයුතු කළ යුතු වීම. | 2.4 (ආ) |
| 2.3(ආ) | අදාළ මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු වීම. (අග්‍රිම) | 2.8 |
| 3.2.2 | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | 3.2 |
| 3.3 (ආ) | කඩිනමින් නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු වීම. | 3.3 (ඉ) |
| 3.3 (ඇ) | නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු වීම. | 3.3 (ක) |

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 නොවැම්බර් 07 දිනැති අංක SA/SD/1/Circular දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 03/2023 මගින් රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් “බී” ගිණුම සඳහා භාවිතා කරමින් තිබූ ආකෘති පත්‍ර සංශෝධනය කර තිබූ අතර 2023 වර්ෂයේ අත්තිකාරම් “බී” ගිණුම එම සංශෝධිත ආකෘති පත්‍ර භාවිතා කරමින් පිළියෙල කළ යුතු වුවත් දෙපාර්තමේන්තුව විසින් නව ආකෘති පත්‍ර භාවිතා කර නොතිබුණි. | නිරීක්ෂණය සමග එකග වෙමි. තවද 2024 වර්ෂයේදී අවසාන ගිණුම පිළියෙල කිරීමේදී නව ආකෘති පත්‍ර ප්‍රකාරව සකස් කර ඉදිරිපත් කරන ලෙස සටහන් කර ගන්නා ලදී. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ ප්‍රකාරව අත්තිකාරම් ගිණුම් පිළියෙල කළ යුතු වීම. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) ආදායම් ලැබීම්**

දෙපාර්තමේන්තුවට අදාළ ආදායම් ලැබීම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | කෘෂි සත්ත්ව හා වෙනත්, සංගීත හා නර්තන, ආරක්ෂක සේවා, ඉදිකිරීම් හා නඩත්තු සේවා යන ආදායම්වලින් දෙපාර්තමේන්තුව සෑම වර්ෂයකම ආදායම් රැස්කරන අතර, සමාලෝචිත වර්ෂයේදී ද එම ආදායම් ප්‍රභවයන්ගෙන් එකතුව රු. මිලියන 1,547.8 ක | ආදායම් ශීර්ෂයක් ලබා ගැනීමට පෙර සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ කාර්යභාරය සම්බන්ධව අමාත්‍ය මණ්ඩල සංදේශයක් මගින් සංශෝධනයක් සිදුකළ යුතු බව දන්වා ඇත. නමුත් වර්තමානයේ | ආදායම් ශීර්ෂයක් ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | ආදායමක් රැස්කර තිබුණි. වාර්ෂිකව උපයනු ලබන මෙම ආදායම් ගිණුම් ගත කිරීමට රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විමසා වෙනම ආදායම් ශීර්ෂයක් ලබා ගැනීමට සමාලෝචිත වර්ෂයේද කටයුතු කර නොතිබුණි. | මෙම දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගත කිරීමට යෝජිත බැවින් හා ඒ සම්බන්ධව සැලසුම් සකස් කරන බැවින්, ආදායම් ශීර්ෂයක් ලබා ගැනීමට කටයුතු කිරීම ප්‍රායෝගික නොවන බව දන්වමි. | |
| **(ii)** | 2022 ජුනි 12 දින රු.720,000 ක මුදලකට රතු කැකුළු සහල් කි.ග්‍රෑ. 4,500 ක් හා රු.480,000 ක මුදලකට සුදු කැකුළු සහල් කි.ග්‍රෑ. 3,000 ක් දියතලාව යුධ හමුදා පුහුණු පාසලට අළෙවි කිරීමෙන් උහන බලකාය වෙත ලැබිය යුතු රු. 1,200,000 ක මුදලක් ද, 2022 දෙසැම්බර්, 2023 ජනවාරි, පෙබරවාරි සහ මාර්තු යන මාසවලදී මහඔය බලකා සාමාජිකයන් වෙත සුදු බෝල සහල් කි.ග්‍රෑ. 12,014 ක් අළෙවි කිරීම වෙනුවෙන් සේවා වනිතා ඒකකය මඟින් මහඔය බලකාය වෙත ලැබිය යුතු රු.1,063,047 ක මුදලක් සහ වැලිසර බලකාය, 2021, 2022, 2023 යන වර්ෂයන්වලදී වී, ධාන්‍ය හා අනෙකුත් බලකා නිෂ්පාදනයන් වෙනුවෙන් ශ්‍රී ලංකා රජයට පියවිය යුතු රු.62,758,801 ක මුදලක් ද ලැබිය යුතුව තිබූ අතර, එම ලැබිය යුතු මුළු මුදල වූ රු.65,021,848 ක් ව්‍යාපෘති අංශය විසින් හඳුනාගෙන වාර්තා කර නොතිබීම හේතුවෙන් 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුලත් කර නොතිබූ අතර, ඒ අනුව හිඟ ආදායම් ප්‍රමාණ එම ප්‍රමාණවලින් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී හිඟ ආදායම් නිසි ලෙස හඳුනාගෙන වාර්තා කිරීමට අවශ්‍ය උපදෙස් ලබාදී ඇත. ඒ අනුව ලැබිය යුතු ආදායම් හා හිඟහිටි ආදායම් සම්බන්ධව ලේඛන යාවත්කාලීන කරමින් තොරතුරු පද්ධතියක් තබා ගැනීම සඳහා උපදෙස් ලබා දී ඇති බව දන්වමි. | සියළුම ව්‍යාපෘති ආදායම් යාවත්කාලීනව නිවැරදිව ගිණුම්වල හඳුනාගැනීමට කටයුතු කළ යුතු වීම. |
| **(iii)** | 2019, 2020 හා 2021 වර්ෂවල හිඟ හිටි ආදායමෙන් පිළිවෙලින් රු.122,000 ක්, රු. 274,000 ක් හා රු. 147,000 ක් ලෙස හිඟව තිබූ රු.543,000 ක් වූ ආදායම් විවිධ හේතූන්මත ආයතන මඟින් අයකර ගත නොහැකි බව දක්වමින් හිඟ ආදායම් ශේෂ වලින් අඩු කර දක්වා තිබූ නමුත් එලෙස ආදායම් කපා හැරීම හෝ අත්හැර දැමීම මුදල් රෙගුලාසි 113 ප්‍රකාරව සිදු කර තිබූ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොවුණි. | හිඟ ආදායම් ලෙස දක්වා ඇති අයකරගත නොහැකි ශේෂ මුදල් රෙගුලාසි 113 ප්‍රකාරව ආදායම් කපාහැරීම හෝ අත්හැර දැමීමට ක්‍රියාකිරීම සඳහා අවශ්‍ය උපදෙස් මේ වන විට ලබාදී ඇති බව කාරුණිකව දන්වමි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර ආදායම් කපා හරින්නේ නම් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

**(ආ) දේපල පිරියත හා උපකරණ**

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ ආදායම් නොවන ලැබීම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | 2022 වර්ෂය තුලදී ගිණුම්වල ඇතුලත් වී තිබුණු අක්කර 1 රූඩ් 3 පර්චස් 16.48 ක් වූ කුරගල බලකා පුහුණු පාසල් ඉඩම, සමාලෝචිත වර්ෂයේදී ද නැවතත් ගිණුම්ගත කිරීමෙන් එම ඉඩමේ වටිනාකම වූ රු.1,100,000 කින් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි දේපල, පිරියත හා උපකරණ වැඩියෙන් දක්වා තිබුණි. | මෙම වටිනාකම දෙපාර්තමේන්තු පොත්වලින් ඉවත් කරමින් දෙපාර්තමේන්තු ඉඩම් ශේෂය නිවැරදි කිරීම සඳහා සටහන් කර ගතිමි. | නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශන තුල දැක්විය යුතුවීම. |
| **(ii)** | අයිතිය පවරාගෙන අවසන් කර තිබූ අක්කර 6 රූඩ් 4 පර්චස් 30.98 කින් යුත් පොළොන්නරුව වැලිකන්ද මූලස්ථාන ඉඩම රු.3,600,000 කට හා පර්චස් 15.4 කින් සමන්විත අම්පාර උහන සමංගල අනුකලාපයේ ඉඩම රු.500,000 කට තක්සේරු කර තිබූ නමුත් සමාලෝචිත වර්ෂයේ ACA 6 තුල ඇතුලත් කර නොතිබුණු අතර, ඒ අනුව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දේපළ, පිරියත හා උපකරණ වටිනාකම් රු.4,100,000 ක් අඩුවෙන් දක්වා තිබුණි. | 2024 මූල්‍ය ප්‍රකාශනයෙහි අදාළ තක්සේරු වටිනාකම් ගොඩනැගිලි (9151) යටතේ ගිණුම් ගත කර මූල්‍ය ප්‍රකාශනය තුල නිරූපණය කිරීම සඳහා සටහන් කර ගතිමි. | නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශන තුල දැක්විය යුතුවීම. |
| **(iii)** | සමාලෝචිත වර්ෂය අවසානය වන විට අයිතිය පවරාගෙන තිබූ හෙක්ටයාර් 11 ක වපසරියකින් යුත් බිම් කැබලි 21 ක් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන වලට ඇතුලත් කර නොතිබුණි. | පෙන්වාදී ඇති වත්කම් ඉඩම් වටිනාකම් නොවන අතර, අදාළ පරිශ්‍රයේ පවතින ගොඩනැගිලිවල තක්සේරු වටිනාකම් බව පෙන්වා දෙමි. එම වටිනාකම් තක්සේරු කර ගිණුම් ගත කිරීම සඳහා ඉදිරිපත් කරන විට 2023 වර්ෂය සඳහා වන ගිණුම් කටයුතු අවසන් කර තිබූ අතර 2024 වර්ෂයේ අවසන් ගිණුම් තුල නිරූපණය කිරීම සඳහා සටහන් කර ගතිමි. | තක්සේරු කර නිවැරදි වටිනාකම් ගිණුම් ගත කළ යුතුවීම. |
| **(iv)** | ප්‍රවාහන අංශයෙන් ලබා දී තිබූ උපලේඛන තුළ ඇතුළත්ව තිබූ තක්සේරු වටිනාකම රු.134,124,000 ක් වටිනා වාහන 58 ක් වාර්ෂික මූල්‍ය ප්‍රකාශන තුල ඇතුළත් ACA 6 ප්‍රකාශයේ ඇතුළත් කර නොතිබූ අතර, ඒ අනුව එම ප්‍රමාණයෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දේපළ, පිරියත හා | මෙම විගණන නිරීක්ෂණය මඟින් ඉදිරිපත් කර ඇති වාහන 58 ක් අතුරින්, වාහන 43 සම්බන්ධව ගිණුම්ගත කිරීම 2024 දෙවන කාර්තුව අවසන් වීමට පෙර සිදුකිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. අනෙකුත් | සියළු වාහන වටිනාකම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශන තුල ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | උපකරණ වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි. | වාහන සම්බන්ධවද පරීක්ෂා කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට උපදෙස් ලබාදී ඇත. | |
| **(v)** | විගණනයට ඉදිරිපත් කල තොරතුරු අනුව දෙපාර්තමේන්තුව සතුව පාපැදි 341 ක් පැවති බව දක්වා තිබූ නමුත් එම පාපැදි වටිනාකම් ගිණුම් තුළ ඇතුළත් වී නොතිබුණි. | මණ්ඩලයක් මගින් දෙපාර්තමේන්තුවේ පාපැදි තක්සේරු කර ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. | පාපැදි වටිනාකම් නිවැරදිව ගිණුම් වල ඇතුලත් කිරීමට කටයුතු කළ යුතුවීම. |
| **(vi)** | 2022 වර්ෂයේ දේපළ, පිරියත හා උපකරණ වටිනාකම රු. 2,314,614,772 ක් වූ අතර 2023 වර්ෂයේදී දේපළ, පිරියත හා උපකරණ වටිනාකම රු.1,761,457,769 ක් විය. ඒ අනුව රු. 553,157,003 කින් එම වටිනාකම අඩු වී තිබුණු අතර, එම වෙනසට හේතුව විගණනයට අනාවරණය නොවුණි. | පරිගණක පද්ධතිය තුල සදොස් ලෙස ඇතුලත් කර යන්ත්‍ර හා උපකරණ වත්කම් පරිගණක පද්ධතියෙන් ඉවත්කර, භෞතික ශේෂ නැවත සත්‍යාපනය කරන ලදී. නමුත් එසේ නැවත සත්‍යාපනය කරන ලද භෞතික ශේෂ සියල්ලම පරිගණක පද්ධතියට කාලපරිච්ඡේදය තුල ඇතුලත් කිරීමට නොහැකි විය. මෙම නිරීක්ෂණයට හේතු වී ඇත්තේ එම පරස්පරතාව බව කාරුණිකව දන්වමි. නිවැරදි කරන ලද ඉතිරි ශේෂ කඩිනමින් පරිගණක පද්ධතියට ඇතුලත් කරන බව කාරුණිකව වැඩිදුරටත් දන්වමි. | සියළුම දේපළ, පිරියත හා උපකරණ වලට අදාළ නිවැරදි වටිනාකම් ගිණුම් තුළ ඇතුළත් කළ යුතු වීම. |

**(ඇ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| **ණය සහ අත්තිකාරම් ලේඛනය** | | |
| 2017 ජූලි 05 දිනැති අංක 256/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 05 ඡේදය ප්‍රකාරව ණය හා අත්තිකාරම් ලේඛනය පිළියෙල කර නොතිබුණු අතර පරිගණක පැතුරුම්පතක් ආධාරයෙන් ණය ශේෂ හා අයකිරීම් සටහන්කර තිබුණි. | දෙපාර්තමේන්තුවේ CC10 ණය ලේඛණ හා අත්තිකාරම් ලේඛන හස්ත ක්‍රමයට (Manual) පවත්වාගෙන නොයන අතර, පරිගණක පැතුරුම්පත් ආධාරයෙන් ණය ශේෂ හා අය කිරීම් සටහන් කරගෙන යනු ලබයි. එයට හේතු වි ඇත්තේ 32,000 ආසන්න හට පිරිසක් සේවයේ යෙදීම බව දන්වා සිටිමි. ඉදිරියේදී CC10 ණය ලේඛණ, පී ලෙජර් ඇතුලත් පරිගණක මෘදුකාංගයක් ලබාගැනීමට සැලසුම් කර ඇත. | 2017 ජූලි 05 දිනැති අංක 256/2017 දරන රජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 05 ඡේදය ප්‍රකාරව සී.සී.10 ආකෘතිය හා ඒ ආකෘතිය පදනම් කරගෙන ණය හා අත්තිකාරම් ලේඛන පිළියෙල කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනයන්හි හිඟ ආදායම් පිළිබඳ වාර්තාව අනුව ආරක්ෂක සේවා හා ව්‍යාපෘති මඟින් සේවා ලබාදීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසන්වන විට රු.133,700,136 ක් දෙපාර්තමේන්තුව වෙත ලැබීමට පැවතුණි. ඉන් ආරක්ෂක සේවා වෙනුවෙන් රු. 11,143,453 ක් ලැබීමට පැවති අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විටද එම ආදායම් අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත්ව වර්ෂ 01 ත් 06 ත් අතර, කාලයක් ගත වී තිබුණි. | නඩු ගොනු කිරීම, ආයතන සමඟ සාකච්ඡා කිරීම වැනි ක්‍රියාමාර්ග නිරවුල් වීමට පවතින හිඟ ශේෂයන් සම්බන්ධව වර්තමානය වන විට පියවර ගෙන ඇත. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතු වීම. |

### 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව සහේතුකව පූර්වානුමාන කළ හැකි සියළුම සේවාවන් ඇස්තමේන්තුවල ඇතුලත් කර ඇති බවටත් ඒවා මුදල් වර්ෂය තුල තම දෙපාර්තමේන්තුවට ඉටුකල හැකි ශක්තිය ඇති බවටත් හා ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් නිවැරදිව පිළියෙල කර ඇති බවටත් ගණන්දීමේ නිලධාරියා වගබලාගත යුතු වුවද , දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය සඳහා සකස් කරන ලද ඇස්තමේන්තු වෙනස් කිරීමේ විචල්‍යතාවය සියයට 23ත් සියයට 133 ත් අතර පරාසයක් දක්වා විහිදී තිබුණි. | පිළිගනිමි. 2023 මුදල් වර්ෂයට අදාල ඇස්තමේන්තු සකස් කරන ලද්දේ 2022 අගෝස්තු මස දී වන අතර, 2023 වර්ෂය තුල ඉන්ධන වියදම ඉහල යාම, විදුලි ගාස්තු ඉහල යාම, ඉන්ධන ගාස්තු ඉහල යාම හා ඩොලරය ඉහල යාම ඇතුළුව සියළුම භාණ්ඩ හා සේවා වල පිරිවැය වැඩි ප්‍රතිශතයකින් ඉහල යාම හේතුවෙන් එම රේඛීය වියදම් අයිතමයන්, ඇස්තමේන්තු ගත කරන ලද පරිදි කළමනාකරණය කර ගත නොහැකි වූ බව කාරුණිකව පෙන්වා දෙමි. | පිළියෙල කරන ලද ඇස්තමේන්තු අනුව වියදම් හැකිතාක් කළමනාකරණය කර ගත යුතු වීම. |
| **(ii)** | වැය විෂයයන් 17 ක ප්‍රතිපාදනයන්හි ඉතිරිය සියයට 10 ත් සියයට 100 ත් දක්වා වූ අතර, ඉන් වැය විෂයන් 03 ක ප්‍රතිපාදන අඩු කිරීමෙන් පසු ද සියයට 28 සිට සියයට 79 දක්වා වූ පරාසයක ඉතිරි වී තිබුණි. තවද, වැය විෂයන් 05 ක ප්‍රතිපාදන මුදල් රෙගුලාසි 66 මඟින් වැඩි කරගැනීමෙන් පසු සියයට 16 සිට සියයට 60 දක්වා වූ පරාසයක ඉතිරිවීම් පැවතුණි. | අත්‍යාවශ්‍ය සේවාවන්හිදී පමණක් අතිකාල යෙදවීම, විදේශ පුහුණු පාඨමාලා සීමා කිරීම, ප්‍රමාණවත් අක්මුදල් නොලැබීම, ප්‍රතිපාදන ඉතිරි කිරීමට එකඟ වීම. | ඇස්තමේන්තු හැකි තාක් නිවැරදිව පිළියෙල කිරීමට කටයුතු කළ යුතු වීම. |

## 2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 නොවැම්බර් 30 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 05/2023 හි 3.3 වගන්තිය අනුව වාර්තා කරන ආයතනයේ ඇති බැදීම් සහ වගකීම් 2023/12/31 දිනට බැදීම් අංක අනුව හෙළිදරවු කළ යුතු වුවත්, 2023 වර්ෂයට අදාළ රු.1,201,338 ක් වූ බැරකම් 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල හෙළිදරවු කර නොතිබුණි. | 2022 වර්ෂය දක්වා බැරකම් ලේඛණය හස්ත ක්‍රමයට යාවත්කාලින කල අතර, 2023 අවසන් ගිණුම් තුල උක්ත බැරකම් ලේඛණ සිගාස් මෘදුකාංග හරහා සකස් කරන ලදි. එහිදි 1205 වැය විෂය යටතේ වන බැදිම් යාවත්කාලින කිරිමට නොහැකි වූ අතර, නිරික්ෂිත අනෙකුත් වැය විෂයන්ට අදාල බැරකම් වර්ෂ අවසාන දිනට වාර්තා නොවිම හේතුවෙන් බැරකම් වශයෙන් ඇතුලත්ව නොමැත. | වර්ෂය අවසානයේ පවත්නා සියළු බැදීම් හා වගකීම් මූල්‍ය ප්‍රකාශන තුළ නිවැරදිව හෙළිදරව් කළ යුතු වීම. |
| (ආ) | මූල්‍ය ප්‍රකාශන තුල හෙළිදරවු කර තිබූ රු.124,703,033 ක් වටිනා බැදීම් හා බැරකම් 2024 වර්ෂයේ මාර්තු මස අවසන් වන විටද දෙපාර්තමේන්තුව විසින් පියවා නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර තිබූ රු.124,703,033 ක් වටිනා බැදීම් නිරවුල් කිරීම සඳහා භාණ්ඩාගාරයෙන් අක් මුදල් ලබා ගැනීමට කාලයක් ගතවූ බැවින් මාර්තු මස අවසන් වනවිට නිරවුල් කිරීමට නොහැකි වී ඇති බව දන්වමි. | කඩිනමින් බැරකම් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. |

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | | |
| (i) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | | |
| | (අ) මුදල් රෙගුලාසි 103 සිට මුදල් රෙගුලාසි 110 | - | පොලොන්නරුව බලකායේ 2023 වර්ෂයේ NLDB කෘෂි ව්‍යාපෘතියේ වී සහ බඩ ඉරිඟු වගාව විනාශ වීම, පොලොන්නරුව බලකාය යටතේ ඇති මාර්න්කේනි | මෙම විගණන නිරීක්ෂණය සම්බන්ධ මුදල් රෙගුලාසි ප්‍රකාරව ක්‍රියාකිරීමට ව්‍යාපෘති හා සිවිල් | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | කජු ව්‍යාපෘතියේ කජු වගාව සඳහා යොදා ගනු ලබන මොස්පිලාන් කෘමි නාශක ග්‍රෑම් 100 පැකට් 2,603 ක් 2023 ජූලි වන විට කල් ඉකුත් වී තිබීම, පොලොන්නරුව බලකායේ නාඩු වී තොග කි.ග්‍රෑම් 20,019 ක ඌණතාවයක් පෙන්නුම් කිරීම සහ අම්පාර බලකාය යටතේ ඇති ලාහුගල කරංකෝව 2022/2023 මහ කන්නයේ වී වගාව විනාශ වීම යන හානි හඳුනාගෙන ඒ සඳහා ක්‍රියාමාර්ග ගෙන ඒවා ලේඛනවල සටහන් කළ යුතු වුවත් එසේ කර නොතිබුණි. | පාලන අංශවලට උපදෙස් ලබාදී ඇත. මේ වන විට නිරීක්ශිත සිදුවීම් සම්බන්ධව පරීක්ෂණ පැවැත්වෙන බවද දන්වමි. | |
| | (ආ) මුදල් රෙගුලාසි 756(6) | - | 2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2023 වර්ෂයේ ජුනි 15 ට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණු අතර, 2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කළ බවට පමණක් ලිපියක් ලබාදී තිබුණි. | CSD/ACCT/09/02 /2023(26) හා 2023.06.30 දිනැති ලිපිය මඟින් 2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා ලබාදී ඇති බව දන්වමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ii) | 1985 මැයි 10 දිනැති අංක 289 හා 1992 අගෝස්තු 19 දිනැති අංක 26/92 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | - | සියළුම වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි. | වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කිරීමට හෝ ස්ටිකර් යෙදීමට කටයුතු කරන බව දන්වමි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 2.5 අවිධිමත් ගනුදෙනු

### (i) අධිකාර බලය නොමැති ගෙවීම්

දෙපාර්තමේන්තුව විසින් අධිකාරී බලය නොමැතිව පහත සඳහන් ගෙවීම කර තිබුණි.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2015 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා දෙපාර්තමේන්තුව විසින් මිය ගිය හා විශ්‍රාම ගිය නිලධාරීන් පිළිවෙලින් 56 දෙනෙකුට හා 37 දෙනෙකුට වැඩිපුර ගෙවා තිබූ වැටුප් රු.1,107,463 ක් හා එම කාලය තුලදී සේවය හැර ගිය නිලධාරීන් 85 දෙනෙකුට වැඩිපුර ගෙවා තිබූ රු.1,914,647 ක් වූ වැටුප් සමාලෝචිත වර්ෂය අවසන් වන විටද අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | මියගිය හා විශ්‍රාම ගිය නිලධාරීන්ගේ අවසන් මස වැටුප මෙසේ බැංකු ගතවී ඇති අතර, එම මුදල් ඔවුන්ගේ විශ්‍රාම/ මරණ පාරිතෝෂික මුදලින් අයකර ඉදිරියේදී මෙම දෙපාර්තමේන්තුව වෙත ලැබීමට නියමිතව ඇත. ඒ අනුව එම මුදල ක්‍රමයෙන් අයවන බව කාරුණිකව දන්වමි. | වැටුප් ගෙවීම් සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනය ශක්තිමත් කළ යුතු වීම හා වැඩිපුර ගෙවන ලද වැටුප් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 2.6 වංචනික ස්වරූපයේ ගනුදෙනු

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ වංචනික ස්වරූපයේ ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූලස්ථානයට අයත් ජීප් රථයකට 2022 සැප්තැම්බර් 17 දින හුන්නස්ගිරිය ප්‍රදේශයේදී එන්ජින් පද්ධතියට සිදු වූ හානියෙන් රු.323,000 ක අලාභයක් සිදුව තිබූ අතර, 2023 දෙසැම්බර් 31 දින වන විටත් එම අලාභය අදාළ පාර්ශවයන්ගෙන් පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | නැවත මූලික විමර්ශනයක් කිරීමට උපදෙස් ලබා දී ඇති බැවින්, සිදු කර ඇති විමර්ශන වාර්තාව විමර්ශන අංශය වෙත යොමු කර ඇත. | අලාභය අදාළ පාර්ශවයන්ගෙන් පියවා ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | වැලිසර උප බලකාය මඟින් පවත්වාගෙන යනු ලබන විශේෂ සහල් ව්‍යාපෘතියෙන් 2021, 2022 හා 2023 යන වර්ෂයන්ට අදාළව බලකා 07 කින් ලබාගත් වී, ධාන්‍ය වර්ග හා අනෙකුත් බලකා නිෂ්පාදනයන්ට අදාළව රු.62,758,801 ක මුදලක් ශ්‍රී ලංකා රජයට පියවිය යුතු වුවත්, 2024 පෙබරවාරි 13 දින වන විටත් එම මුදල් පියවා නොතිබූ අතර එම වටිනාකම් පියවීමට ප්‍රමාණවත් මුදල් හෝ සහල් තොගද, වැලිසර සහල් ව්‍යාපෘතිය සතුව නොතිබුණි. | අමාත්‍යාංශ මට්ටමින් මණ්ඩලයක් පත් කර විමර්ශනයක් සිදු කරමින් පවතී. | කඩිනමින් මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 2.7 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි 91 මඟින් සංශෝධනය කරන ලද මුදල් රෙගුලාසි 371(2) (ආ) සහ 371(5) අනුව කිසියම් විශේෂිත කාර්යයකට ලබාදුන් අතුරු අග්‍රිමයක් එම කාර්යය නිම කළ විගසම හෝ අදාළ කාර්ය නිමකර දින 10 ක් තුල නැවත පියවිය යුතු වුවද දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේ අවස්ථා 65 කදී ලබාදී තිබූ එකතුව රු.5,491,244 ක් වූ අත්තිකාරම් දින 11 ත් දින 323 ත් අතර, ප්‍රමාදයකින් යුක්තව පියවා තිබුණි. | අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම සම්බන්ධ ක්‍රමවේදය සමාලෝචනය කර මුදල් රෙගුලාසි අනුව කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත. ඒ අනුව අදාල කාර්යය නිමවූ වහාම අත්තිකාරම් පියවීමටත්, නැවත මෙවැනි නිරික්ෂණ ඇති නොවීමට කටයුතු කිරිම සඳහාත් අවශ්‍ය උපදෙස් ලබා දී ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව අත්තිකාරම් පියවීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | සංශෝධිත මුදල් රෙගුලාසි 371(2)(ආ) වගන්තිය අනුව කිසියම් විශේෂිත කාර්යයක් සඳහා මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් එක් අවස්ථාවකදී රු.100,000 ක උපරිමයක් දක්වා තත්කාර්යය අතුරු අග්‍රිමයක් ලබාදිය හැකි අතර මූල්‍ය සීමාවන් ඉක්මවීමට අවශ්‍යවන අවස්ථාවලදී භාණ්ඩාගාරයේ පූර්ව අවසරය ලබාගත යුතු වුවත් ආයතනය විසින් සමාලෝචිත වර්ෂය තුල අවස්ථා 15 කදී එම සීමාව ඉක්මවා හා භාණ්ඩාගාරයේ පූර්ව අවසරය ලබා නොගෙන එකතුව රු.3,929,350 ක අත්තිකාරම් ලබාදීමට කටයුතු කර තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව මාණ්ඩලික නිලධාරියෙකුට අත්තිකාරම් ලබාදිය යුතු වුවද, දෙපාර්තමේන්තුවේ සිටින මාණ්ඩලික නිලධාරීන් ප්‍රමාණය අඩු බැවින් හදිසි අවශ්‍යතා මත විටින් විට අත්තිකාරම් ලබාදීමට සිදුවී ඇත. නමුත් එලෙස අත්තිකාරම් ලබාදීම පිළිබඳව අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් දැනට සිදුකර ඇති බැවින් ඉදිරියේදී මෙවැනි නිරීක්ෂණ සිදු නොවීමට ක්‍රියාමාර්ග ගෙන ඇති බව කාරුණිකව දන්වමි. | අත්තිකාරම් ලබා දීමේදී මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | අවස්ථා 10 කදී ලබාගත් රු.323,100 ක අත්තිකාරම් මුදල් වියදම් කිරීමකින් තොරව දින 05 ත් දින 126 ත් අතර කාල පරාසයක් නිශ්කාර්යව අත රඳවාගෙන සිටීමෙන් පසුව සම්පූර්ණ අත්තිකාරම් මුදලම, මුදලින් පියවා තිබුණි. | පුද්ගලික ආරක්ෂක පාඨමාලා ඇතුලු කටයුතු සඳහා බාහිර ආයතන වෙතින් සහභාගී වූ භට පිරිස් සඳහා වියදම් දැරීමට අග්‍රිම වශයෙන් ලබා දී ඇති මුදල් බව කාරුණිකව දන්වමි. නමුත් මෙම ක්‍රමවේදය නැවත වරක් සමාලෝචනය කර බැලීම සඳහා මේ වන විට වාර්තා කිරීමේ ක්‍රමවේදය විධිමත් කිරීමට පියවර ගෙන ඇත. | නිශ්චිත කාර්යයක් සඳහා ලබා ගත් අත්තිකාරම් මුදල් එම කාර්යය සඳහා උපයෝජනය නොවන්නේ නම් කඩිනමින් අත්තිකාරම් මුදල් පියවීමට කටයුතු කළ යුතු වීම. |

## 2.8 බැංකු ගිණුම් මෙහෙයවීම

බැංකු ගිණුම් මෙහෙයවීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ අඩුපාඩු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුවට අදාල අංක 7042755 දරණ බැංකු ගිණුමේ සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට පැවති රු.10,172,367 ක් වූ හඳුනානොගත් ලැබීම් අවස්ථා 107 ක් 2024 ජනවාරි 31 දින වන විටත් හඳුනාගෙන නොතිබුණි. | මෙම මුදල් කඩිනමින් නිරවුල් කර ගැනීමට කටයුතු කරන අතර, දැනට හඳුනා නොගත් ලැබීම් 83 දක්වා අඩුකරගෙන ඇති බව ද පෙන්වා දෙමි. මෙලෙස හඳුනා නොගත් ලැබීම් ඉදිරියේදී කඩිනමින් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කරන බව දන්වමි. | සෘජු ප්‍රේෂණ කඩිනමින් හඳුනාගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | දෙපාර්තමේන්තුවට අදාල අංක 7042755 දරණ බැංකු ගිණුමේ සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට පැවති රු.1,252,809 ක් වූ හඳුනානොගත් ගෙවීම් අවස්ථා 04 ක් 2024 ජනවාරි 31 දින වන විටත් හඳුනාගෙන නොතිබුණි. | මෙම හඳුනා නොගත් ගෙවීම් අවස්ථා 04 න් 02 ක් නිරවුල් කර ඇති අතර, ඉතිරි හඳුනා නොගත් ගෙවීම් 2024 අප්‍රේල් මස බැංකු සැසඳුමෙන් නිරවුල් වී ඇති බව කාරුණිකව දන්වමි. | හඳුනානොගත් ගෙවීම් කඩිනමින් හඳුනා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 දේශීය අරමුදල්වලින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **මාර්න්කේනි කජු ව්‍යාපෘතිය** | | |
| (i) | පොලොන්නරුව බලකායට අයත් මාර්න්කේනි කජු ව්‍යාපෘතිය අක්කර 187 කින් සමන්විත වන අතර ඉන් අක්කර 155 ක භූමි ප්‍රදේශයක් තුල කජු ගස් සිටුවා ඇති බව සඳහන් වුවද, එම භූමි ප්‍රදේශය නිවැරදි ලෙස මැන සිතියම් ගත කර නොතිබූ බැවින් වගා කර ඇති භූමි ප්‍රමාණයෙහි ආදායම් වියදම් ගණනය කිරීමේ නිරවද්‍යතාව තහවුරු නොවීය. | කජු සංස්ථාව සතු මෙම කජු ව්‍යාපෘතියේ ඇති ඉඩම් කොටස අක්කර 187ක් බව සඳහන්ව ඇතත් එය මිණුම් කර නොමැත. එම නිසා ඉඩම් කොටස මිනුම් කටයුතු කර ස්ථිර වැටක් ඉදිකිරීම සඳහා කජු සංස්ථාව වෙත දැන්වීමට කටයුතු කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. | භූමි ප්‍රමාණය නිශ්චිතව හඳුනා ගත යුතු වීම හා ආදායම් වියදම් යාවත්කාලීනව හා නිවැරදිව හඳුනා ගත යුතු වීම. |
| (ii) | පොලොන්නරුව බලකායට අයත් මාර්න්කේනි කජු ව්‍යාපෘතියේ කජු ගස් 8,787 ක් ඇති බව සඳහන් වුවද, වර්තමානය වන විට එහි පවතින්නේ කජු ගස් 3,682 ක් වීම හේතුවෙන් කජු ගස් 5,105 ක ඌණතාවයක් වූ අතර එම ඌණතාවය සම්බන්ධයෙන් මු.රෙ.103, 104, 110 ප්‍රකාරව දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි. | කජු ගස්/ පැල නිවැරදිව ගණනය කිරීමක් ව්‍යාපෘතිය ආරම්භයේ සිදුකර නොමැති වීම හේතුවෙන් මූලික අවස්ථාවේ දී මෙම ව්‍යාපෘතිය තුල කජු ගස් 8,787 ක ප්‍රමාණයක් ඇති බවට සඳහන් වී ඇත. නමුත් මෙහි සත්‍ය වශයෙන් පවතින්නේ කජු පැල 3,682 ක් බව දන්වමි. ඒ අනුව එම කජු ගස් ප්‍රමාණයට අදාල ජීව දත්ත රෙජිස්ටරයක් පවත්වාගෙන යාමට මේ වන විට උපදෙස් ලබා දී ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (iii) | කජු වගාව සඳහා භාවිතා කරන මොස්පිලාන් ඇසිටමිප්‍රිඩ් නම් කෘමිනාශක ග්‍රෑම් 100 පැකට් 2,930 ක් 2022 හා 2023 වර්ෂවලදී මිල දී ගෙන තාවකාලික ගබඩාවේ අනාරක්ෂිතව ගබඩා කර තිබූ අතර එම පැකට් සියල්ල 2023 ජූලි වන විට කල් ඉකුත් වීම හේතුවෙන් රජයට සිදු වී තිබූ අලාභය රු.3,123,600 කට ආසන්න විය. | මෙම මිල දී ගැනීම සම්බන්ධව පරීක්ෂණයක් සිදුකරන බව දන්වා සිටිමි. මෙම කජු වගාවේ හෝ කොණ්ඩච්චි කජු වගාවේ අවශ්‍යතා සඳහා යොදා ගැනීමට උපදෙස් ලබා දී ඇත. කෙසේ නමුත් මේ පිළිබඳව පරීක්ෂණයක් ක්‍රියාත්මකවන බව කාරුණිකව දන්වමි. මෙවැනි නිරීක්ෂණ නැවත ඇති නොවීමට සඳහා විශේෂයෙන් කජු වගාවට යොදන රසායන ද්‍රව්‍ය සම්බන්ධ අවශ්‍යතාවය, මිලදී ගැනීම්, යෙදවීම්, තොග පාලනය යනාදිය | අවශ්‍යතාවය සඳහා පමණක් මිලදී ගැනීමට කටයුතු කිරීම සහ මිලදී ගන්නා කෘමි නාශක නිසි කලට වගාවන්ට යොදා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | | සම්බන්ධ පවතින ක්‍රමවේද සම්පූර්ණයෙන් වෙන් වෙන්ව සමාලෝචනය කර අවශ්‍ය අභ්‍යන්තර පාලනයන් යෙදීමට මේ වන විට පියවර ගෙන ඇත. | |
| (iv) | පොලොන්නරුව බලකායේ තොග පොතෙන් මාර්න්කේනි උපබලකායට මොස්පිලාන් ඇසිටම්ප්‍රිඩ් කෘමිනාශක ද්‍රව්‍ය පැකට් 1,980 ක් නිකුත් කර තිබූ නමුත් එය මාර්න්කේනි උපබලකායේ තොග පොත්වල සඳහන් වී තිබුණේ පැකට් 1,916 ක් වීම හේතුවෙන් පැකට් 64 ක ප්‍රමාණයක ඌනතාවක් පැවති අතර, එහි වටිනාකම රු.76,800 ක් විය. | මේ පිළිබඳ පරීක්ෂා කර වාර්තාවක් ලබා දෙන ලෙස වර්තමාන අණදෙන නිලධාරී වෙත දැනුම් දී ඇති අතර, එම වාර්තාව ලැබුණු පසු ඉදිරිකටයුතු සිදුකරන බව කාරුණිකව දන්වා සිටිමි. | උප බලකා තොග පොත් අතර වෙනසකම් ඇති නොවන ලෙසට නිසි කළමනාකරණයක් ඇති කළ යුතු වීම. |
| **(ආ)** | **NLDB කෘෂි ව්‍යාපෘතිය** | | |
| (i) | පොලොන්නරු බලකායට අයත් ජාතික පශු සම්පත් මණ්ඩලය සතු අක්කර 90 ක් වූ ගල්ලැල්ල ප්‍රදේශයේ පිහිටි භූමියෙහි සිදු කරන ලද කෘෂි ව්‍යාපෘතිය සඳහා අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිඛිත අනුමැතියකින් තොරව ආරම්භකර තිබුණි. | මෙම නිරීක්ෂණ ද ඇතුලුව පොලොන්නරුව බලකායේ කටයුතු සම්බන්ධව විමර්ෂණයක් සිදුකර, ඉන් අනතුරුව අභ්‍යන්තර මූලික පරීක්ෂණ මණ්ඩලයක්ද පත්කර පරීක්ෂාවක් සිදුකර ඇත. රේඛීය අමාත්‍යාංශය වෙත වාර්තා කර ඉදිරි පියවර ගැනීම සිදුකරන බව දන්වා සිටිමි. | ව්‍යාපෘතීන් සඳහා ලිඛිත අනුමැතියක් ලබා ගත යුතු වීම. |
| (ii) | මෙම ඉඩම පොලොන්නරුව බලකාය විසින් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය වෙත නැවත භාර දී තිබූ අතර ඒ වන විට එහි වී සහ බඩ ඉරිඟු වගාව සඳහා රු.1,395,060 ක වියදමක් දරා රු.324,100 ක පමණ ආදායමක් ලබා තිබූ අතර ඒ හේතුවෙන් රු.1,070,960 ක පාඩුවක් දෙපාර්තමේන්තුවට සිදු වී තිබුණි. | මෙම නිරීක්ෂණ ද ඇතුලුව පොලොන්නරුව බලකායේ කටයුතු සම්බන්ධව විමර්ෂණයක් සිදුකර, ඉන් අනතුරුව අභ්‍යන්තර මූලික පරීක්ෂණ මණ්ඩලයක්ද පත්කර පරීක්ෂාවක් සිදුකර ඇත. රේඛීය අමාත්‍යාංශය වෙත වාර්තා කර ඉදිරි පියවර ගැනීම සිදුකරන බව දන්වා සිටිමි. | අලාභ ඇති නොවන පරිදි වගා ව්‍යාපෘතීන් සිදු කළ යුතු වීම. |
| **(ඇ)** | **ලාහුගල කරංකෝව වී වගා ව්‍යාපෘතිය** | | |
| (i) | අක්කර 70 ක වී වගා ව්‍යාපෘතියෙන් වී කිලෝග්‍රෑම් 105,000 ක අස්වැන්නක් හා ඉන් රු.12,600,000 ක ආදායමක් ලබාගත හැකි බවට තොරතුරු | මෙම ප්‍රදේශයට පැවති අධික නියන් සහිත කාලගුණ තත්ත්වය හේතුවෙන් වගාභූමිය ආසන්නයෙන් ගලා බසිනා හැඩ ඔයද වියළී තත්වයට පත්වී ඇත. ඒ | ප්‍රායෝගිකව ලබා කරගත හැකි අස්වැන්න පදනම් කරගත් ව්‍යාපෘති වාර්තා සැකසිය යුතු |

| | | | |
|---|---|---|---|
| | ඉදිරිපත් කර සැලසුම අනුමත කරවාගෙන තිබුණද, සත්‍ය ලෙස ලද අස්වැන්න කිලෝග්‍රෑම් 24,500 ක් හා ඉන් ලද ආදායම රු. 1,849,750 ක් වූ අතර ළඟා විය නොහැකි ඉලක්ක ව්‍යාපෘති වාර්තාවලට ඇතුලත් කර ඇති බව නිරීක්ෂණය විය. | අනුව ව්‍යාපෘතියට අවශ්‍ය ජලය ලබාගත නොහැකි වී ඇත. ව්‍යාපෘති යෝජනාවේ සැකසීමේදී දෙපාර්තමේන්තු මූලස්ථානය මඟින් ලබා දී ඇති චක්‍රලේඛණ හා උපදෙස් වලට අනුකූලව අක්කරයකින් ලබා ගත හැකි අස්වනු ප්‍රමාණය කි.ග්‍රෑම් 1500 ක් ලෙස ගණනය කර ඇති අතර ප්‍රදේශයේ පැවති වී මිල ගණන් වලට සාපේක්ෂව මිල රු.120 ක් ලෙස ගෙන ආදායම ගණනය කර ඇත. කෙසේ වෙතත් මෙම වගා ව්‍යාපෘතිය සම්බන්ධයෙන් අවභාවිතාවක් හෝ අක්‍රමිකතාවයක් ඇතිද යන්න සොයා බැලීම සඳහා මා විසින් මණ්ඩලයක් ද පත්කර ඇති බවත්, එහි වාර්තාව අනුව ඉදිරිකටයුතු සිදුකරන බවත්, වැඩිදුරටත් දන්වා සිටිමි. | වීම. |
| (ii) | වී වගා ව්‍යාපෘති සැලසුම අනුව භටයින් 64 දෙනෙකු යෙදවීමට සැලසුම්කර තිබුණද සත්‍ය ලෙස ව්‍යාපෘති කටයුතු සඳහා භටයින් 74 දෙනෙකු යොදවා තිබූ හෙයින් විධිමත් අනුමැතියකින් තොරව වැඩිපුර භටයින් දස දෙනෙකු යොදවා තිබුණි. තවද, ව්‍යාපෘතිය සඳහා රු.21,528,146 ක වියදමක් සමාලෝචිත වර්ෂයේ දී දරා ඇති අතර මෙම ව්‍යාපෘතියෙන් ලද ආදායම රු.1,849,750 ක මුදලක් බැවින් රජයට සිදු වූ පාඩුව රු.19,678,396 ක් විය. | ව්‍යාපෘති යෝජනාවේ ව්‍යාපෘතිය සඳහා භටයින් 64 දෙනෙකු යෝජනා කර තිබුනද, අවශ්‍යතාවය මත අක්කර 01 ක් සඳහා එක් භටයකු වන ලෙස භටයින් 70 ක් හා අධීක්ෂණ නිලධාරීන් 04 ක් වශයෙන් 74 දෙනෙකු යොදවා ඇත. විශේෂ රාජකාරි පිටව ගොස් නැවත කාර්යාලයේ අතිරික්ත සිටි භට පිරිස අතිරේක වශයෙන් මේ සඳහා යොදවා ඇත. | අලාභ ඇති නොවන අයුරින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කළමනාකරණය කටයුතු කළ යුතු වීම. |

## 3.2 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රසම්පාදන අත්පොතෙහි 7.11.1 හි "ලංසු ඇගයීමේ වාර්තාව" යන පරිච්ඡේදය අනුව සියලුම ලංසුකරුවන්ට, තාක්ෂණික පිරිවිතරයන්ගේ ප්‍රධාන පිරිවිතරවලට | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව ලංසු ඇගයීමේදී හා එම වාර්තාව සකස් කර ඉදිරිපත් කිරීමේදී සැලකිල්ලට ගත යුතු කරුණු සම්බන්ධවව | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | ලංසුකරුවන්ගේ අනුකූලතාවය පෙන්නුම් කරන වගුවක් ලංසු ඇගයීමේ වාර්තාව තුල ඇතුලත් විය යුතු බව දක්වා තිබුණද, දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේ දී රු.5,907,940 ක වියදමක් දරමින් ප්‍රසම්පාදනයන් හතරක් සිදුකර තිබූ නමුත් එවන් වගුවක් තාක්ෂණික ඇගයීම් වාර්තාවේ ඇතුලත් කර නොතිබුණි. | දැනුවත් කිරීමේ මාර්ගෝපදේශයක් සකස් කරමින් පවතින අතර ඉදිරියේදී මෙවැනි නිරීක්ෂණ ඇති නොවීමට කටයුතු කරන බව විගණනයට සනාථ කරමි. මේ සඳහා ප්‍රසම්පාදන අංශයට උපදෙස් ලබා දී ඇත. | |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ක්‍රීඩා ඇඳුම් මිලදී ගැනීමේ ප්‍රසම්පාදනයේදී අවම ලංසුකරු හා උපරිම ලංසුකරු ඉදිරිපත් කරන ලද මිල ගණන් අතර, රු. 1,328,154 ක් දක්වා විශාල මිල පරාසයක් ඇති වී තිබුණි. මෙලෙස මිල පරාසයක් ඇති වීමට හේතුව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ (ඇ) වගන්තිය ප්‍රකාරව තාක්ෂණික පිරිවිතර සකසා නොතිබීම බව නිරීක්ෂණය විය. | වාර්ෂිකව සිදුකල යුතු මිලදී ගැනීම් සඳහා සම්මත තාක්ෂණික පිරිවිතර විෂය දැනුම ඇති කමිටු මගින් සකස් කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කරමින් පවතින බව කාරුණිකව දන්වමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | ප්‍රසම්පාදන අත්පොතෙහි 7 වන වගන්තිය ප්‍රකාරව ලංසු ඇගයීමේ අදියරයන් තුල, ලංසු ලේඛනයේ නිශ්චය කොට දක්වා නොමැති ඇගයීම් සාධක ලංසු ඇගයීමේදී භාවිතා නොකළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ දී රු.4,760,172 ක් වටිනා ප්‍රසම්පාදන දෙකකදී තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ලංසු ඇගයීමේදී ලංසු ලේඛනයේ සඳහන් කර නොතිබූ ඇගයීම් සාධක ලංසු ඇගයීම සඳහා යොදා ගැනීමට කටයුතු කර තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව ලංසු ඇගයීමේදී තාක්ෂණික ඇගයීම් කමිටුවල වගකීම හා ඇගයීම සිදුකිරීම සම්බන්ධවව සැලකිල්ලට ගත යුතු කරුණු පිළිබඳ දැනුවත් කිරීමේ මාර්ගෝපදේශයක් සකස් කරමින් පවතින අතර ඉදිරියේදී මෙවැනි නිරීක්ෂණ ඇති නොවන පරිදි කටයුතු කිරීමට ප්‍රසම්පාදන අංශයට උපදෙස් ලබා දී ඇති බව කාරුණිකව දන්වමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දී රු.2,229,195 ක් වැයකර ග්ලාස් ක්ලීනර් සහ එයාර් ෆ්‍රෙෂ්නර් ස්ප්‍රේ මිලදීගැනීමේ දී ලංසු ලේඛනවල භාණ්ඩ ඒකකයක අඩංගු විය යුතු දියර පරිමාව සඳහන් කර නොතිබීම හේතුවෙන් ලංසුකරුවන් විසින් විවිධ පරිමාවන් සඳහා මිල ගණන් ඉදිරිපත් කර තිබූ අතර මෙම පරිමාවන් වෙනස් වීම ලංසු ඇගයීමේදී අවධානයට ලක් කර නොතිබුණි. | ඉදිරියේදී මෙවැනි නිරීක්ෂණ ඇති නොවීමටත් අවශ්‍යතාවය නිශ්චිත කර ලංසු ලේඛණ වලට ඇතුලත් කිරීමට අවශ්‍ය උපදෙස් ප්‍රසම්පාදන අංශයට ලබා දී ඇති බව කාරුණිකව දන්වමි. | ලංසු ලේඛන පිළියෙල කිරීමේදී පිරිවිතර පරිපූර්ණව සැකසීමට ප්‍රසම්පාදන කමිටුව වග බලා ගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3 වගන්තිය ප්‍රකාරව සියළුම ආශ්‍රිත වියදම් ඇතුලු මුළු පිරිවැය ඇස්තමේන්තුව ප්‍රසම්පාදන අස්තිත්වය විසින් පිළියෙල කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් රු.4,111,572 ක වියදමක් දරා කැනෝන් ටෝනර් 77 ක් මිලදී ගැනීමට අදාළව, මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර නොතිබුණි. | ඇස්තමේන්තුගත මුළු පිරිවැය, වෙනම ලේඛණයක් ලෙස පිලියෙල කර නොමැති අතර, ඉදිරියේදී පූර්ව තාක්ෂණික ඇගයීම් කමිටු පත් කිරීමේදී පිරිවිතර සමග නිවැරදි පිරිවැය ඇස්තමේන්තුවක් නිවැරදිව ඇතුලත් කිරීමට කටයුතු කරන ලෙස අවශ්‍ය උපදෙස් ප්‍රසම්පාදන අංශයට ලබා දී ඇති බව කාරුණිකව දන්වමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ රු.4,838,293 කට ඇස්තමේන්තු කරමින් විල්පත්තු බලකායේ ඇගළුම් කර්මාන්තශාලාව සඳහා ගොඩනැගිලි ද්‍රව්‍ය මිලදී ගැනීමේ දී ලංසුකරුවන් 9 දෙනෙකු විසින් ලංසු ඉදිරිපත් කර තිබූ නමුත් ඉන් ලංසුකරුවන් 4 දෙනෙකු ඉදිරිපත් කර තිබූ මිල ගණන් අධ්‍යක්ෂ (භටකාර්ය සම්පාදන) විසින් අත්සන් යොදා තිබූ හා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර තිබූ ලංසු ලේඛන යොදා ගැනීම වෙනුවට වෙනත් ආකෘතියක ලංසු ලේඛන, ලංසු ඉදිරිපත් කිරීම සඳහා භාවිතා කර තිබූ අතර තාක්ෂණික ඇගයීම් කමිටුව ලංසු ඇගයීමේදී ද ඒ පිළිබඳ අවධානය යොමු කර නොතිබුණි. | ඉදිරියේදී සම්මත ආකෘතීන් භාවිතා කර මිල ගණන් ලබාගැනීම සඳහා ලංසුලේඛනවල වගන්තියක් ඇතුලත් කිරීමට උපදෙස් ලබාදෙන ලදී. තවද මිල ගණන් කැඳවීමට සම්මත ලංසු ලේඛන භාවිතා කිරීමට උපදෙස් ද ලබා දුන් බව වැඩිදුරටත් දන්වා සිටිමි. | ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කරන ලද ලංසු ලේඛන භාවිතා කළ යුතු වීම. |

## 3.3 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගිණුම් අංශය විසින් රු. 69,310,000 කට ගිණුම් ගත කර තිබූ ප්‍රදේශ 6 ක පිහිටා ඇති අක්කර 176 රූඩ් 3 පර්චස් 39.5 ක් ගිණුම් තුල පැවති නමුත් දෙපාර්තමේන්තුව සතුව එවන් ඉඩම් කැබලි 6 ක් නොමැති බව පාලන අංශය ලබා දුන් තොරතුරු අනුව නිරීක්ෂණය විය. | සොයාබලා අවශ්‍ය නිවැරදි කිරීම් සිදුකිරීමට, මෙම වත්කම් පොදු 287 ආකෘතියට අනුව හරි වැරදි බැලීම කල යුතු අතර ඒ සඳහා මණ්ඩලයක් පත්කර අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකරන බව කාරුණිකව දන්වා සිටිමි. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මගින් ඉඩම් හා ගොඩනැගිලි සත්‍යාපනය නොවන බැවින් ඔබගේ නිරික්ෂණ කෙරෙහි විශේෂ අවධානයක් යොමුකර ඉහත මණ්ඩලය මගින් ක්‍රියාකර වාර්තාවක් කඩිනමින් සැපයිමටත්, ඒ අනුව අවශ්‍ය නිවැරදි කිරීම් සිදුකිරීමටත් | ගිණුම් අංශය හා පාලන අංශයේ තොරතුරු අතර පරස්පරතා ඇති නොවන සේ කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | | කටයුතු කරන බව වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි. | |
| (ආ) | ගිණුම් අංශය විසින් රු. 198,846,000 කට ගිණුම් ගත කර තිබූ ප්‍රදේශ 4 ක පිහිටා තිබූ ඉඩම් කැබලි 4 ක් අක්කර 121 රූඩ් 2 පර්චස් 33.12 ක් ලෙස දක්වා තිබූ නමුත් පාලන අංශය විසින් ලබා දී තොරතුරු අනුව එම ඉඩම් කැබලි වල මුළු භූමි ප්‍රමාණය අක්කර 33 රූඩ් 2 පර්චස් 35.48 ක් වූ අතර ඒ අනුව අක්කර 88 කින් පමණ භූමි ප්‍රමාණයේ වෙනසක් නිරීක්ෂණය විය. | සොයාබලා අවශ්‍ය නිවැරදි කිරීම් සිදුකිරීමට, මෙම වත්කම් පොදු 287 ආකෘතියට අනුව හරි වැරදි බැලීම කල යුතු අතර ඒ සඳහා මණ්ඩලයක් පත්කර අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකරන බව කාරුණිකව දන්වා සිටිමි. ඉහත මණ්ඩලය මගින් ක්‍රියාකර වාර්තාවක් කඩිනමින් සැපයීමටත්, ඒ අනුව අවශ්‍ය නිවැරදි කිරීම් සිදුකිරීමටත් කටයුතු කරන බව වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි. | ගිණුම් අංශය හා පාලන අංශයේ තොරතුරු අතර පරස්පරතා ඇති නොවන සේ කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | හෙක්ටයාර් 2.17 ක සේරුපිට බලකා ඉඩම හා සමෘද්ධි මාවත, පරණ මැදවච්චිය, ඇලපාත නමින් අක්කර 4 ක ඉඩමක් ගිණුම් අංශය විසින් රු.13,400,000 හා රු.1,500,000 කට ගිණුම් ගත කර තබූ නමුත් මෙම ඉඩම් සඳහා තක්සේරු වටිනාකමක් පාලන අංශය ලබාදී නොතිබුණි. | සොයාබලා අවශ්‍ය නිවැරදි කිරීම් සිදුකිරීමට, මෙම වත්කම් පොදු 287 ආකෘතියට අනුව හරි වැරදි බැලීම කල යුතු අතර ඒ සඳහා මණ්ඩලයක් පත්කර අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකරන බව කාරුණිකව දන්වා සිටිමි. ඉහත මණ්ඩලය මගින් ක්‍රියාකර වාර්තාවක් කඩිනමින් සැපයීමටත්, ඒ අනුව අවශ්‍ය නිවැරදි කිරීම් සිදුකිරීමටත් කටයුතු කරන බව වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි. | ගිණුම් අංශය හා පාලන අංශයේ තොරතුරු අතර පරස්පරතා ඇති නොවන සේ කටයුතු කළ යුතු වීම. |
| (ඈ) | ගිණුම් අංශය විසින් පලුගස්වංගුව, සිරිපුර නමින් රූඩ් 1 පර්චස් 28.4 ක ඉඩමක් රු.513,000 කට ගිණුම්ගත කර තිබූ නමුත් පාලන අංශයේ ලබාදුන් තොරතුරු අනුව ශ්‍රී පුර උප බලකායේ භූමි ප්‍රමාණය දක්වා නොතිබුණි. | සොයාබලා අවශ්‍ය නිවැරදි කිරීම් සිදුකිරීමට, මෙම වත්කම් පොදු 287 ආකෘතියට අනුව හරි වැරදි බැලීම කල යුතු අතර ඒ සඳහා මණ්ඩලයක් පත්කර අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකරන බව කාරුණිකව දන්වා සිටිමි. ඉහත මණ්ඩලය මගින් ක්‍රියාකර වාර්තාවක් කඩිනමින් සැපයීමටත්, ඒ අනුව අවශ්‍ය නිවැරදි කිරීම් සිදුකිරීමටත් කටයුතු කරන බව වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි. | ගිණුම් අංශය හා පාලන අංශයේ තොරතුරු අතර පරස්පරතා ඇති නොවන සේ කටයුතු කළ යුතු වීම. |
| (ඉ) | දෙපාර්තමේන්තුව විසින් දීර්ඝ කාලයක සිට දිවයිනේ විවිධ ප්‍රදේශවල පරිහරණය කරමින් පැවතුණු බිම් කැබලි 554 කින් 2023 දෙසැම්බර් 31 | මේවන විට නිරීක්ෂිත ඉඩම් පවරා ගැනීමට දෙපාර්තමේන්තුව ක්‍රියාකරමින් පවතින බව කාරුණිකව දන්වා සිටිමි. | නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | දින වන විටත් බිම් කැබලි 30 කට අදාළ හෙක්ටයාර් 21.086 ක ඉඩම් ප්‍රමාණයක් පමණක් පවරා ගැනීමට කටයුතු කර තිබූ අතර, ඉතිරි බිම් කැබලි 524 ක ප්‍රමාණය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පවරා ගැනීම් කටයුතු අවසන්කර නොතිබුණි. | | |
| (ඊ) | මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද ACA 6 ප්‍රකාශයේ රු. 740,456,671 ක් වටිනා ප්‍රවාහන උපකරණ තුළ වාහන 579 ක් ඇතුළත් වූ නමුත් ප්‍රවාහන අංශයෙන් ලබා දී තිබූ වාහන ලැයිස්තුව තුළ වාහන 502 ක් පමණක් ඇතුළත් වී තිබුණි. | විගණන නිරීක්ෂණය මඟින් ඉදිරිපත් කර ඇති ACA 6 ඇතුලත් වාහන සහ ප්‍රවාහන අංශය වාර්තා කර ඇති වාහන අතර වෙනසට හේතු සහ ලියාපදිංචි විස්තර පරික්ෂා කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට උපදෙස් ලබාදී ඇති බව කාරුණිකව දන්වා සිටිමි. | ගිණුම් අංශය හා පාලන අංශයේ තොරතුරු අතර පරස්පරතා ඇති නොවන සේ කටයුතු කළ යුතු වීම. |
| (උ) | මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් කර තිබූ රු. 100,345,435 ක් වටිනා වාහන 135 ක් ප්‍රවාහන අංශයෙන් ලබා දී තිබූ උපලේඛන තුල ඇතුළත් කර නොතිබූ අතර, එම වාහන සම්බන්ධයෙන් තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය. | විගණන නිරීක්ෂණය මඟින් ඉදිරිපත් කර ඇති ACA 6 ඇතුලත් වාහන සහ ප්‍රවාහන අංශය වාර්තා කර ඇති වාහන අතර වෙනසට හේතු සහ ලියාපදිංචි විස්තර පරික්ෂා කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට උපදෙස් ලබාදී ඇති බව කාරුණිකව දන්වා සිටිමි. | ගිණුම් අංශය හා පාලන අංශයේ තොරතුරු අතර පරස්පරතා ඇති නොවන සේ කටයුතු කළ යුතු වීම. |
| (ඌ) | ප්‍රවාහන අංශය සහ ගිණුම් අංශය යන අංශයන් දෙකෙහිම පැවති වාහන 444 ක් අතුරින් රු.140,135,000 ක් වටිනා වාහන 82 ක් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී නොතිබුණි. | විගණන නිරීක්ෂණය මඟින් ඉදිරිපත් කර ඇති ACA 6 ඇතුලත් වාහන සහ ප්‍රවාහන අංශය වාර්තා කර ඇති වාහන අතර වෙනසට හේතු සහ ලියාපදිංචි විස්තර පරික්ෂා කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට උපදෙස් ලබාදී ඇති බව කාරුණිකව දන්වා සිටිමි. | වාහන වල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (එ) | ACA 6 තුල ගිණුම්ගත වී නොමැති ප්‍රවාහන අංශය තුල තොරතුරු ඇතුලත් වාහන 58 කින් වාහන 38 | විගණන නිරීක්ෂණය මඟින් ඉදිරිපත් කර ඇති ACA 6 ඇතුලත් වාහන සහ ප්‍රවාහන අංශය වාර්තා කර ඇති වාහන අතර වෙනසට හේතු සහ ලියාපදිංචි | වාහන වල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු වීම හා දෙපාර්තමේන්තුවට |

| | | | |
|---|---|---|---|
| | ක් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී නොතිබුණි. තවද, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී තිබූ වාහන 108 ක් පිළිබඳ තොරතුරු ප්‍රවාහන අංශය සතුව නොවීය. | විස්තර පරීක්ෂා කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට උපදෙස් ලබාදී ඇති බව දන්වා සිටිමි. | අයත් වාහන පිළිබඳ තොරතුරු දෙපාර්තමේන්තුව සතුව පැවතිය යුතු වීම. |
| (ඒ) | ප්‍රවාහන අංශය තුල විස්තර ඇතුලත් නොවූ ACA 6 තුල ඇතුලත් වූ වාහන 135 කින් වාහන 78 ක් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී නොතිබුණි. තවද, දෙපාර්තමේන්තුවට අයත් වාහන පිළිබඳ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වාහන උපලේඛනයේ ඇතුලත් වාහන 71 ක් ACA 6 තුල ද ඇතුලත් වී නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන්හි මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි දේපළ, පිරියත හා උපකරණ වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි. | විගණන නිරීක්ෂණය මඟින් ඉදිරිපත් කර ඇති ACA 6 ඇතුලත් වාහන සහ ප්‍රවාහන අංශය වාර්තා කර ඇති වාහන අතර වෙනසට හේතු සහ ලියාපදිංචි විස්තර පරීක්ෂා කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට උපදෙස් ලබාදී ඇති බව දන්වා සිටිමි. | වාහන වල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු වීම හා ගිණුම් තුළ දෙපාර්තමේන්තුව සතු වාහන සියල්ල ඇතුළත් කළ යුතු වීම. |
| (ඔ) | මේ අනුව ප්‍රවාහන අංශය හා ගිණුම් අංශය නඩත්තු කරන ලේඛන දෙක තුලම ඇතුලත් නොවූ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව නමින් ලියාපදිංචි වාහන 128 ක් පැවතුණු අතර, මින් වාහන 108 ක් (ප්‍රවාහන අංශයේ විස්තර නොමැති) දෙපාර්තමේන්තුව තුල පවතින බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි. | විගණන නිරීක්ෂණය මඟින් ඉදිරිපත් කර ඇති ACA 6 ඇතුලත් වාහන සහ ප්‍රවාහන අංශය වාර්තා කර ඇති වාහන අතර වෙනසට හේතු සහ ලියාපදිංචි විස්තර පරීක්ෂා කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට උපදෙස් ලබාදී ඇත. ACA 6 ඇතුලත් වාහන සහ ප්‍රවාහන අංශය වාර්තා කර ඇති වාහන අතර වෙනසට හේතු සහ ලියාපදිංචි විස්තර පරීක්ෂා කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට උපදෙස් ලබාදී ඇති බව දන්වා සිටිමි. | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව නමින් ලියාපදිංචි වාහන සියල්ල දෙපාර්තමේන්තුව සතු විය යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | දෙපාර්තමේන්තුව විසින් මෙතෙක් අයිතිය පවරා නොගත් තක්සේරු වටිනාකම රු.43,410,000 ක් වූ වාහන 40 ක් පවතින බව දක්වා තිබූ නමුත් ඉන් එක් වාහනයක් වූ GA-4428 දරන වාහනය මොටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව නමින් ලියා පදිංචි වී තිබුණි. | | |
| (ඕ) | දෙපාර්තමේන්තුව විසින් මෙතෙක් අයිතිය පවරා නොගත් තක්සේරු වටිනාකම රු.43,410,000 ක් වූ වාහන 40 ක් පවතින බව දක්වා තිබූ නමුත් ඉන් GA-4428 දරන වාහනය මොටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව නමින් ලියා පදිංචි වී තිබුණි. | විගණන නිරීක්ෂණය මඟින් ඉදිරිපත් කර ඇති ACA 6 ඇතුලත් වාහන සහ ප්‍රවාහන අංශය වාර්තා කර ඇති වාහන අතර වෙනසට හේතු සහ ලියාපදිංචි විස්තර පරික්ෂා කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට උපදෙස් ලබාදී ඇති බව දන්වා සිටිමි. | නිවැරදිව වාහන තොරතුරු දෙපාර්තමේන්තුව තුළ පවත්වා ගත යුතු වීම. |
| (ක) | විවිධ අමාත්‍යාංශවලට හා දෙපාර්තමේන්තුවලට අයත් වාහන 36 ක් දෙපාර්තමේන්තුව විසින් දීර්ඝ කාලයක සිට පරිහරණය කරමින් තිබෙන නමුත්, එම වාහන වල නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ වන විට පවරා ගැනීමට ක්‍රියාකරමින් පවතින වාහන සංඛ්‍යාව 22 කි. වාහන 14 විස්තර නොමැති බව දන්වමි. දැනට අපහරණ තත්ත්වයේ වාහන වලින් තවදුරටත් පවරා ගත යුතු වාහන සංඛ්‍යාව 27 කි. එයින් අයිතිය පවතින රජයේ ආයතන වෙත අපහරණය සඳහා බාරදීමට ක්‍රියාකරමින් පවතින වාහන 05 ඇති අතර මණ්ඩලයක් මඟින් මෙම කටයුත්ත සම්බන්ධව ක්‍රියාකරමින් පවතින බව කාරුණිකව දන්වමි. | නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

### 3.4 රජයේ නිලධාරීන් ඇප තැබීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 880 සහ 891 ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ ඇප තැබිය යුතු විධායක තනතුරු 07 කට හා ද්විතීයික තනතුරු 02 කට අදාළ නිලධාරීන් 70 දෙනෙකුට අදාළ ඇප මුදල් තබා නොතිබුණි. | ඉදිරි මාසය තුල ඇප තබා අවසන් කරන බව කාරුණිකව දන්වා සිටිමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 3.5 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මහඔය බලකාය යටතේ බක්කි ඇල්ල අනුකලාපයේ 2010 හා 2012 වර්ෂයන් හි පවත්වාගෙන ගොස් තිබුණු ගඩොල් ව්‍යාපෘතීන්හි ඇති වී තිබූ ගඩොල් 762,322 ක ඌණතාවයක් නිසා රු.5,447,590 ක පාඩුවක් දෙපාර්තමේන්තුවට සිදු වී තිබුණි. 2023 දෙසැම්බර් 31 දින වන විටත් ඉන් රු.2,255,672 ක් පමණක් අයකර ගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර තිබූ නමුත් රු.3,191,918 ක් වූ ඉතිරි මුදල අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. | තවදුරටත් රු.3,242,165 ක මුදලක් අයකර ගැනීමට ඇත. තවද, මෙම අය කිරීම සම්බන්ධයෙන් විධිමත් අනුමැතියක් ලැබෙන තෙක් අයකර ගැනීම තාවකාලිකව අත්හිටුවන මෙන් MOD/CSD/CSD/03/08/1 හා 2024.01.31 දිනැති ආරක්ෂක අමාත්‍යාංශ ලිපිය මඟින් දැනුම් දී ඇති අතර මේ සම්බන්ධව විගණන හා කළමනාකරන කමිටු රැස්වීමේදී සාකච්ඡා කරන ලදී. අමාත්‍යාංශ අනුමැතිය ලද පසු ඉතිරි මුදල් අයකිරීමට නියමිත බව දන්වා සිටිමි. | ඉතිරි මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | කතරගම බලකා මූලස්ථානයේ පළල අඩි 16 ක් හා දිග අඩි 903 ක් වන ප්‍රධාන අභ්‍යන්තර මාර්ග පද්ධතිය 2016 වර්ෂයේදී කොන්ක්‍රීට් අතුරා නවීකරණය කිරීම සඳහා ප්‍රදේශයේ පුද්ගලික ආයතනයකින් මිලදී ගත් සිමෙන්ති, ගල්, වැලි ඇතුළු ඉදිකිරීම් ද්‍රව්‍ය කතරගම බලකා මූලස්ථානයට ලැබී නොතිබූ අතර, එම මාර්ගයේ අළුත්වැඩියාව ද සිදු නොකර තිබීමෙන් රු.579,124 ක අලාභයක් දෙපාර්තමේන්තුවට සිදු වී තිබුණි. 2023 දෙසැම්බර් 31 දින වන විටත් ඉන් රු.144,781 ක් පමණක් අයවී තිබුණි. | වගකිව යුතු යුධ හමුදා නිලධාරීන් වෙතින් ඉතිරි අයකර ගැනීම් සඳහා අවැසි කටයුතු සිදුකර දෙන ලෙසට ඉල්ලීමක් කර සීඑස්ඩී/1/1/2/8 ( ) හා 2023.12.14 දිනැති ලිපිය මඟින් යුධ හමුදාපති වෙත යොමුකර ඇති අතර එම මුදල් අයවීමෙන් පසු ඔබ වෙත වාර්තා කරන බව කාරුණිකව දන්වා සිටිමි. | ඉතිරි මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසන්වන විට තවදුරටත් අයිතිය පවරාගෙන තක්සේරු කර ගිණුම්වලට ගෙන නොතිබුණු බිම් කැබලි 524 ක ඉදිකර තිබූ ගොඩනැගිලිවල වටිනාකම රු.746,203,209 ක් විය. තවද මෙසේ පවරා නොගත් ඉඩමක් වූ විල්පත්තුව බලකායෙහිද සමාලෝචිත වර්ෂයේ නැවතත් | මේ සඳහා මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරිමට අවශ්‍ය උපදෙස් ලබාදුන් බව කාරුණිකව දන්වා සිටිමි. | ඉදිකිරීම් සිදු කිරීමට පෙර ඉඩමේ අයිතිය නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | ගොඩනැගිලි ඉදිකිරීමක් සිදුකර තිබූ අතර, ඒ සඳහා වැයකර තිබූ මුදල රු.16,156,769 ක් විය. | | |
| (ඈ) | උහන හා මහඔය බලකා විසින් 2021, 2022 හා 2023 වර්ෂවලදී දියතලාව යුධ හමුදා පුහුණු පාසලට හා සේවා වනිතා ඒකකයට අළෙවි කරන ලද බලකා නිෂ්පාදනයන් සඳහා අයවිය යුතු රු. 2,263,047 ක මුදල අදාල ආයතනයන්යන්ගෙන් අයකර ගෙන ශ්‍රී ලංකා රජයට පියවීමට අදාල බලකා කටයුතු කර නොතිබුණි. | අයකර ගැනීම් සිදුකිරීමට අමාත්‍යාංශ මට්ටමින් මණ්ඩලයක් පත්කර විමර්ශනයක් සිදු කරමින් පවතින බව කාරුණිකව දන්වා සිටිමි. | කඩිනමින් මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඉ) | අවශ්‍යතාවය නිසි ලෙස හඳුනා ගැනීමකින් තොරව මිලදී ගන්නා ලද ජල නල උපකරණ වර්ග 76 කට අදාළව අයිතම 2,291 ක් වසර 15 කට අධික කාලයක සිට ද, 2021 වර්ෂයේදී රු.304,400 ක් වටිනා පොලිසැක් උර 2,000 ක් වසරකට අධික කාලයක සිටද, සේරුපිට ගබඩාව තුල නිශ්කාර්යව පැවතුණි. | මෙම පුහුණු පාසල ඇතුළුව බලකා හා පුහුණු පාසල් සියල්ලේම අතිරික්තතා සම්බන්ධව අභ්‍යන්තර විගණක විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ ප්‍රකාරව ක්‍රියාකර, අතිරික්ත අයිතමයන් අවශ්‍යතා ඇති ස්ථානවලට ලබා දීම සහ, තවදුරටත් නිෂ්කාර්යය අයිතම විධිමත් පටිපාටියකට අනුව ටෙන්ඩර් කිරීමට කටයුතු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග මේ වන විට ගෙන ඇති බව කාරුණිකව දන්වමි. | ඵලදායී ජීව කාලය ඉක්ම යාමට ප්‍රථම භාවිතයට ගැනීමටත් මිලදී ගැනීමට ප්‍රථම අවශ්‍යතාවය නිසි පරිදි හඳුනා ගැනීමටත් කටයුතු කළ යුතු වීම. |
| (ඊ) | සේරුපිට බලකායට අයත් කාර්යයන් සඳහා යොදා ගන්නා ලොරි රථයක් අලුත්වැඩියාව සඳහා 2022 නොවැම්බර් 30 දිනැති තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව අනුව අවම මිල ඉදිරිපත් කර තිබූ පුද්ගලික ආයතනයකින් රු.1,250,000 ක මුදලකට සිදුකිරීමට තාක්ෂණික ඇගයීම් කමිටුව නිර්දේශ කර තිබූ නමුත් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 ප්‍රකාරව රු.500,000 ක් ඉක්මවන සේවා ප්‍රසම්පාදනයේදී කොන්ත්‍රාත්කරු හා ප්‍රසම්පාදන අස්ථිත්වය අතර, එළැඹි විධිමත් ලිඛිත ගිවිසුමක් තිබිය යුතු වුවත් එලෙස කටයුතු කර නොතිබුණි. තවද, අලුත්වැඩියාව සඳහා අධ්‍යක්ෂ (ප්‍රවාහන) ගේ අනුමැතියකින් | උක්ත ලොරි රථයේ අළුත්වැඩියාව සඳහා කොන්ත්‍රාත් ප්‍රදානයක් සිදුකර නොමැති අතර වැයවන මුදලට සාපේක්ෂව ඵලදායී ආයුකාලයක් අපේක්ෂා කල නොහැකි බැවින්, සුදුසු ඉදිරිපියවරක් ගැනීම සඳහා මණ්ඩලයක් පත් කර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා මේ වන විට කටයුතු කරමින් පවතින බව කාරුණිකව දන්වමි. අනුමැතිය අපේක්ෂාවෙන් හෝ අළුත්වැඩියා සඳහා ලබා දී දීර්ඝ කාලයක් වාහන ගරාජවල පැවතීම වළක්වා ගැනීම සඳහා මේ වන විට අළුත්වැඩියා ප්‍රගති සමාලෝචන රැස්වීම් මාසිකව පැවැත්වීම සඳහා අවශ්‍ය උපදෙස් | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම හා වාහන අළුත්වැඩියාව නිසි පරිදි කළමනාකරණය කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | තොරව 2022 නොවැම්බර් 17 දින ලොරි රථය තෝරා ගත් ගරාජය තුළ නවතා තිබූ අතර, 2024 මාර්තු 20 දින වන විටත් අලුත්වැඩියා කිරීමකින් තොරව පැවතුණි. වාහන අලුත්වැඩියාවන් නිසි ලෙස කළමනාකරණය නොකිරීම නිසා මෙම තත්ත්වය උදා වී ඇති බව නිරීක්ෂණය විය. | ප්‍රවාහන අංශයට ලබා දී ඇත. | |
| (උ) | දෙපාර්තමේන්තුව සතු බලකා, පුහුණු පාසල් හා කාර්යාල මඟින් භාවිතයෙන් ඉවත් කරන ලද රථ වාහන 113 ක් අපහරණය කිරීම සඳහා සේරුපිට බලකා මූලස්ථානයේ ගාල්කර තිබූ අතර, මෙම බලකායට මෙම රථ ලැබී ඇත්තේ 2018 – 2023 කාල පරිච්ඡේදය තුල විය. මෙම රථ දීර්ඝ කාලයක් අපහරණය කිරීමකින් තොරව පැවතීම නිසා විශාල ලෙස හානි වීම් සිදුව තිබූ අතර විගණිත දිනය වූ 2024 මාර්තු 20 දිනවන විටත් මෙම රථ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම කරුණ සම්බන්ධව අවස්ථා කීපයක දී විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්වල සාකච්ඡා කර ඇති අතර 2016 පෙර රාජසන්තක කල වාහන සම්බන්ධ ගත යුතු ක්‍රියාමාර්ග සම්බන්ධව උපදෙස් අපේක්ෂිතව ප්‍රමාදයක් සිදු වී ඇති බව සඳහන් කරමි. වර්තමානය වන විට පුවත්පත් දැන්වීම් පලකර ඇති අතර ටෙන්ඩර් කැඳවා අලෙවි කිරීමට කටයුතු කරමින් පවතින බව කාරුණිකව දන්වමි. | වාහන අපහරණය දෙපාර්තමේන්තුවට අවාසිදායක තත්ත්වයන් ඇති වීමට ප්‍රථම කඩිනමින් සිදු කිරීමට කළමනාකරණය වග බලා ගත යුතු වීම. |
| (ඌ) | වැලිසර බලකායේ ගබඩාව තුල වසර 05 ත් 20 ත් දක්වා පැරණි නිකුත් නොවී පවතින නිල ඇඳුම් අයිතම 31 ක් ද, වර්ෂ 02 ත් 08 ත් දක්වා පැරණි නිකුත් නොවී පවතින ටයර් සහ ටියුබ් ඒකක 268 ක් ද, වර්ෂ 04 ත් 11 ත් අතර නිකුත් නොවී පවතින ගොඩනැගිලි ද්‍රව්‍ය සහ විදුලි උපකරණ 93 ක් ද, වර්ෂ 05ත් 13ත් අතර නිකුත් නොවී පවතින ලිපි ද්‍රව්‍ය, ටෝනර් සහ පරිගණක උපාංග අයිතම 17 ක ඒකක 26,417 ක් ද නිෂ්කාර්යව පැවතුණි. මින් විගණනයට ඉදිරිපත් කරන ලද නිල ඇඳුම් තොග අයිතම 20 ක වටිනාකම රු.5,946,501 ක් ගොඩනැගිලි ද්‍රව්‍ය සහ විදුලි උපකරණ වර්ග 21 ක වටිනාකම රු. 762,809 ක් හා ටයර් හා ටියුබ් ඒකක 195 ක වටිනාකම රු.2,310,917 ක් ද විය. | අතිරික්තතා සම්බන්ධව අභ්‍යන්තර විගණක විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ ප්‍රකාරව ක්‍රියාකර, අතිරික්ත අයිතමයන් අවශ්‍යතා ඇති ස්ථානවලට ලබා දීම සහ, තවදුරටත් නිෂ්කාර්යය අයිතම විධිමත් පටිපාටියකට අනුව ටෙන්ඩර් කිරීමට කටයුතු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග මේ වන විට ගෙන ඇති බව කාරුණිකව දන්වමි. මේ වන විට අතිරික්ත ටයර් සම්බන්ධව මොරටුව විශ්වවිද්‍යාලයේ නියෝජිතයෙක් ලබා ගෙන දෙපාර්තමේන්තු අවශ්‍යතාවය පවතින ටයර් හා ටියුබ් තොග පමණක් තොගයේ තබා ගැනීමටත් ඉතිරි තොග ආරක්ෂක අමාත්‍යංශය හා සම්බන්ධීකරණය වී ත්‍රිවිධ හමුදාව හා පොලිස් දෙපාර්තමෙන්තුවට රාජ්‍ය ආයතන අතර හුවමාරු කිරීමේ | අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන මිලදී ගැනීම් සිදු කළ යුතු වීම හා පවත්නා උපකරණ ඵලදායී ආර්ථික කටයුත්තකට යෙදවීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | | පදනම මත ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බවද දන්වමි. | |
| (එ) | ප්‍රසම්පාදන හා තාක්ෂණික ඇගයීම් කමිටු විසින් බීජ අවශ්‍යතාවය නිසි පරිදි ඇගයීමක් සිදු නොකර බීජ මිලදී ගැනීම ද, නිසිකලට වේලාවට වගා නොකිරීම හා පසු විපරම් කිරීමක් සිදු නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දී රු. 1,067,202 ක් වටිනා බීජ ප්‍රභේද 8 කට අයත් බීජ කි.ග්‍රෑ 2,112 ක් භාවිතයට නුසුදුසු තත්ත්වයෙන් පැවතුණි. | ගබඩාවේ පවතින සෙමෙන් නිකුත් වන මෙම තොගයන්ගේ ඉදිරි අවශ්‍යතාවයන් නැවත ඇණවුම් කිරීම සිදු නොකරන ලෙසත් මෙම තොගයන් මගින් හැකි උපරිම ප්‍රයෝජන ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී භාවිතා කරන ලෙසටත් නිසි උපදෙස් අධ්‍යක්ෂ ප්‍රසම්පාදන මගින් ලබාදීමට කටයුතු කර ඇති බව දන්වමි. | අවශ්‍යතාවයට පමණක් මිලදී ගැනීම් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ඒ) | ව්‍යාපෘති අංශයේ ලිඛිත නියෝගය පරිදි බලකාවලින් වී නිකුත් කිරීම් කළ යුතු වුවද, එසේ නියෝගයකින් තොරව පොලොන්නරු බලකාය සතු වී කි.ග්‍රෑ. 75,150 ක ප්‍රමාණයක් පෞද්ගලික සහල් මෝලකට නිකුත් කර තිබූ අතර, එහි වටිනාකම රු.7,890,750 ක් විය. | ඉදිරියේ දී සියළුම කෘෂි නිෂ්පාදන හෝ වෙනත් බලකා නිෂ්පාදන අලෙවිය ව්‍යාපෘති අංශයේ ලිඛිත අනුමැතිය මත සිදු කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇති අතර වී සහල් කිරීම සම්බන්ධව උපදෙස්මාලාවක් මේ වන විට නිකුත් කර ඇති බව කාරුණිකව දන්වමි. | ව්‍යාපෘති අංශයේ ලිඛිත නියෝගය පරිදි බලකාවලින් වී නිකුත් කිරීම් කළ යුතු වීම. |
| (ඔ) | පොළොන්නරු බලකායේ තොග ලේඛණයන්ට අනුව නාඩු වී කිලෝ ග්‍රෑම් 98,539 ක් පැවති නමුත් පත්කරන ලද මණ්ඩලය විසින් වී තොග කිරුම් කිරීමේ දී ගබඩාවේ ඇති සත්‍ය තොගය කිලෝ ග්‍රෑම් 84,035 ක් බව අනාවරණය වී තිබූ අතර ඒ අනුව වී කිලෝ ග්‍රෑම් 14,504 ක ඌණතාවක් නිරීක්ෂණය විය. එහි වටිනාකම රු1,675,067 ක් විය. තවද, පොළොන්නරු බලකායේ තොග ලේඛණයන්ට අනුව සම්බා වී කිලෝ ග්‍රෑම් 11,054 ක් පැවති නමුත් පත්කරන ලද මණ්ඩලය විසින් වී තොග කිරුම් කිරීමේ දී ගබඩාවේ ඇති සත්‍ය තොගය කිලෝ ග්‍රෑම් 11,585 ක් බව සඳහන් කර තිබූ හෙයින් සම්බා වී තොග කිලෝ ග්‍රෑම් 531 ක අතිරික්තයක් පෙන්නුම් කල අතර, එහි වටිනාකම රු. 55,746 ක් විය. මෙම ඌණතා හා අතිරික්තතා | මිනුම් කිරීමේදී යම් දෝශයක් හෝ ගණනය කිරීමේදී අත්වැරැද්දක් සිදුව ඇති බව නිරීක්ෂණය කරමි. කෙසේ වෙතත් නාඩු වී කිලෝ 14,504 ප්‍රමාණය අඩුවීම සම්බන්ධ මේ වන විට මණ්ඩලයක් මගින් පරීක්ෂා කරන බව කාරුණිකව දන්වමි. | නෙළන ලද අස්වැන්න ආරක්ෂාකාරීව ගබඩා කළ යුතු වීම හා ඌණතාවයන් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගැනීම. |

| | | | |
|---|---|---|---|
| | සම්බන්ධයෙන් වගකිවයුතු පාර්ශවයන් හඳුනාගෙන නොතිබුණි. | | |
| (ඕ) | හිඟ හිටි ණය ශේෂ අතර මියගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.155,492 ක් වූ වර්ෂ 2 ට වඩා පැරණි ණය ශේෂයක් ද, විශ්‍රාම ගිය නිලධාරීන් 10 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 1,475,631 ක් වූ වර්ෂ 2 ට වඩා පැරණි ණය ශේෂයන් ද, සේවය අතහැර ගොස් තිබූ නිලධාරීන් 53 දෙනෙකුගෙන් අයවිය යුතු වසර 5 කට වඩා පැරණි රු.4,141,473 ක් වූ ණය ශේෂද, වර්ෂ 2 – 5 ත් දක්වා පැරණි නිලධාරීන් 78 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 7,635,965 ක් වූ ණය ශේෂ පැවතුණි. ඒ අනුව මෙම ණය ශේෂ අයකර ගැනීමේ ප්‍රමාණවත් ප්‍රගතියක්ද නිරීක්ෂණය නොවීය. | මිය ගිය හා විශ්‍රාම ගිය නිලධාරීන්ගේ අයවිය යුතු ණය ශේෂ විශ්‍රාම පාරිතෝශිතයෙන් අඩු කර මෙම දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කිරීමෙන් අනතුරුව පියවා ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. තවද, රු. 155,492 ණය ශේෂය නිලධාරිණියකගේ නොඉල්ලුමට ඇතුලත් කර ඇති බව කාරුණිකව පෙන්වා දෙමි. අත්තිකාරම් බී ගිණුම සම්බන්ධව පවතින හිග ශේෂ අයවීම පරීක්ෂා කර එම ගිණුම විධිමත් කිරීම හා නිවැරදිව පවත්වා ගෙන යාම සඳහා අධ්‍යක්ෂ ජනරාල් විසින් සිආදෙ/1/1/3/18() අංක දරන 2022.08.17 දිනැති ලිපිය මගින් මණ්ඩලයක් පත් කර ඇති අතර, එම මණ්ඩලය විසින් මේවන විට කේවල ශේෂ ලැයිස්තුවේ පැවති දෝෂයන් බොහෝදුරට නිරවුල් කර අවසන්ව ඇති හෙයින් එම කේවල ශේෂ අය කර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. | හිඟ ණය ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඵ) | නිලධාරීන් 102 ක ගෙන් සමාලෝචිත වර්ෂය අරම්භයේ අයවීමට පැවති එකතුව රු.14,904,310 ක් වූ ණය ශේෂ වර්ෂය තුලදී අයකර ගැනීමට අපොහොසත් වී තිබීමෙන් එම ආරම්භක ණය ශේෂ එලෙසම වර්ෂය අවසානයේදී ද අත්තිකාරම් ශේෂ තුල ඇතුලත්ව තිබුණි. | නිලධාරීන් අවසන් වරට අනුයුක්තව රාජකාරී කළ සේවා ස්ථානභාර අණදෙන නිලධාරීන් මගින් අදාල ණයකරුවන් දැනුවත් කර ඇත, එක් එක් ණයකරුවන්ට අදාල ඇපකරුවන්ගේ වැටුපෙන් වාරික වශයෙන් අයකර ගැනීමට දැනටමත් කටයුතු කර ඇත. නිලධාරියාට ගෙවිය යුතු අර්ථසාධක අරමුදල, යහසාධක හා සුවසවිය අරමුදල් අංශ වෙතින් මෙම හටයන්ට ගෙවිය යුතු මුදලක් ඇත්නම් එමගින් අයකර ගැනීමට ලිපි යොමු කර ඇත. | ණය ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |